# විසිඑක්වන සියවසට නව දර්ශනයක්

ජනාධිපතිනි
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

BKT 0223
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# 21 වෙනි සියවසේ දර්ශනය

ජනාධිපති ලේකම් කාර්යාලය
16 DEC 2003
පුස්තකාලය

පොදුජන එක්සත් පෙරමුණ රජයේ
පස්වන සංවත්සරය
වෙනුවෙන්

අතිගරු ජනාධිපතිනි

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය
විසින් පවත්වන ලද කතාව
අනුසාරයෙන් සකස් කරන ලද්දකි.

1999 අගෝස්තු මස 21 වැනි දින.

*ගෞරවණීය ස්වාමීන්වහන්ස/පූජකවරුනි,*
*පොදුජන එක්සත් පෙරමුණේ නායකවරුනි,*
*මැති ඇමතිවරුනි,*
*සියලුම රජයේ නිලධාරීන්ගෙන් අවසරයි,*

**මිත්‍රවරුනි,**

අනාදිමත් කාලයක් තිස්සේ අප රටේ පැවැති ශ්‍රේෂ්ඨ උරුමයන් හා සම්ප්‍රදායන් විනාශ කරමින් මතු වූ දශක දෙකකට ආසන්න අඳුරු භීෂණකාරී යුගයට එරෙහිව සටන් කළ හා දිවි පිදූ එසේම අනේක වදහිංසාවලට ගොදුරු වූ අප රටේ ආගමික හා දේශපාලන නායකයින්, එම සටනට නායකත්වය දුන් ගොවි-කම්කරුවන් ඇතුලු සියලු ජනතාව, යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් සටන් වැදුනු මාධ්‍යවේදීන් මම මේ අවස්ථාවේ දී ගෞරවයෙන් සිහිපත් කිරීමට කැමැත්තෙමි.

මීට වසර 5කට පමණ ප්‍රථම අපේ රට යළි ගොඩනැංවීමේ, ඒ ශුද්ධ වූ කාර්යභාර්ය අප භාර ගත්තේ පැහැදිලි දර්ශනයක් ඇතිවයි. එසේම එම දර්ශනය ක්‍රියාත්මක කිරීමට පැහැදිලි සැලැසුම් හා ක්‍රියාමාර්ග අප සතුය.

ගත වූ පස් වසර තුළ අප ආ මග පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරමින් නව සියවස සහ නව සහශ්‍රය වෙනුවෙන් අප විසින් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන 21 වන සියවසේ නව දැක්ම සඳහා වූ අපේ අදහස් ඉදිරිපත් කිරීමට මම ඔබෙන් අවසර පතමි.

> **"මානව සමාජයේ ඉතිහාසය ඉදිරියට ගියේ විවිධාකාර වූ යුග හා කාලවකවානු පසුකර ගෙනය."**

මානව සමාජයේ ඉතිහාසය ඉදිරියට ගියේ විවිධාකාර වූ යුග හා කාලවකවානු පසුකර ගෙනය. අපේ රටට

උරුම වී ඇති දීර්ඝ ඉතිහාසයේ එවැනි යුග කිහිපයක් පැහැදිලි ව හඳුනා ගත හැකිය.

1. ක්‍රි.පූ. 3 වන සියවසේ සිට 13 වන සියවස දක්වා වූ යුගය මේ ශ්‍රී ලංකාද්වීපයේ ප්‍රබුද්ධ ශිෂ්ටාචාර යුගය වශයෙන් හඳුන්වා දිය හැකියි. ඒ පශ්චාත් බෞද්ධ යුගයයි.

ඉන් පසු එළඹි සියවස් 3ක පමණ කාලය සමාජය ක්‍රමක්‍රමයෙන් පිරිහී ගිය යුගය වශයෙන් සැලැකෙයි.

විනාශයත් නිර්මාණයත් එකවිට සිදු වූ මේ යුගයේ දී දේශීය වූ බොහෝ ද මේ කාලය තුළ දී විනාශයට පත්වුණා. අප දේශීය සාරධර්ම, හර පද්ධති වටිනාකම්, සංස්කෘතිය, ආර්ථික සහ දේශපාලන ව්‍යුහයන් විනාශ වී ගියා. මෙහි ඵලවිපාක වශයෙන් මුළුමහත් සමාජ රටාවම පරිහානියට පත් වූ අතර ම වාණිජ ධනවාදය පදනම් කර ගත් නව යුගයක් ගොඩනැගීමේ ක්‍රියාදාමය ද ඒ සමග ම ආරම්භ වුණා. මේ තත්වය ඇති වුණේ සම්පූර්ණයෙන්ම බටහිර ආකල්ප හා බටහිර සාරධර්ම පදනම් කරගෙනයි. මේවා තනිකරම බටහිර සමාජය සඳහා නිර්මාණය කළ ඒවා. බටහිර සිරිත් විරිත් හා සමාජ ආර්ථික ක්‍රම ශ්‍රී ලංකා ජාතියේ හිස මත පැටවූයේ බලහත්කාරයෙන්.

බටහිර සිරිත් විරිත් හා සමාජ ආර්ථික ක්‍රම ශ්‍රී ලංකා ජාතියේ හිස මත පැටවූයේ බලහත්කාරයෙන්.

වසර 450ක කාලයක් මුළුල්ලේ පැවැති මේ ගැටුම්කාරී සමාජ ආර්ථික ක්‍රියාදාමය හේතුවෙන් අපේ රටේ සමාජ, දේශපාලන හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි බරපතළ කැළඹිලි හා පෙරළිකාර තත්වයන් ඇතිවුණා. මෙය අපේ රටට පමණක් නොවෙයි. සියලුම යටත් විජිත ජාතීන්ට පොදු වූ තත්ත්වයක්.

මෙම යුගයේ හොඳ පැත්තකුත් දකින්නට පුළුවන්. අප නවීනත්වය කරා ගමන් කළේ මේ කාලය තුළ දී. විද්‍යාව, අධ්‍යාපනය, සෞඛ්‍ය හා එක්තරා ප්‍රමාණයක මාර්ග, විදුලි සංදේශ හා විදුලි බලය වැනි ආර්ථික යටිතල පහසුකම් ආරම්භ වුණේ මේ කාලය තුළ දී, මේ සමග ම ඇති වූ අයහපත් තත්ත්වය ද අමතක කරන්නට බැහැ. අපට ස්ථාවර සමාජ පදනමක් තිබුණා.

ඉතාමත් හොඳින්, පැහැදිලි ව හඳුනාගත හැකි ජාතික අනන්‍යතාවක් හා ආර්ථික සමාජ ව්‍යූහයක් ද තිබුණා. ඊට සම්බන්ධ වූ උසස් තාක්ෂණික පද්ධතියකුත් තිබුණා. හොඳ සංස්කෘතියක් හා කලාවක් ද තිබුණා. අප උසස් කොට සැලැකූ මේ සියල්ල ම අපට කිසිසේත් හුරුනොවූ සංවර්ධන රටාවක් වෙත ඇදගෙන ගියේ බලහත්කාරයෙන්. මේ ස්වභාවය තුළින් මතු වූ අතිවිශාල ගැටුම්කාරී තත්වයන් මේ වන විටත් සම්පූර්ණයෙන් සමථයකට පත් වී නැහැ.

මී ළඟට අපට හමුවන්නේ 1948 සිට ආරම්භ වන පශ්චාත් යටත් විජිත යුගයයි. මෙම යුගයට ගෙවී ගිය පනස් වසර කාලපරිච්ඡේද හතරකට බෙදන්න පුළුවන්.

පළමු යුගය, 1948 සිට 1956 දක්වා, මෙය පශ්චාත් යටත් විජිත මාර්ගය ඔස්සේ රට සෙමින් ඉදිරියට ගිය වකවානුවයි.

අනිත් යුගය, 1956 සිට 1977 දක්වා, මෙය ජාතික පුනර්ජීවනයේ යුගය ලෙස හඳුන්වන්නට පුළුවන්. එය පොදු ජනතාවගේ යුගයයි.

1956 සිට 1977 දක්වා, මෙය ජාතික පුනර්ජීවනයේ යුගය ලෙස හඳුන්වන්නට පුළුවන්. එය පොදු ජනතාවගේ යුගයයි.

වසර 450 ක්වූ යටත් විජිත යුගයේ දී ස්වකීය අයිතිවාසිකම් අහිමි ව සිටි ශ්‍රී ලංකාවේ බහුතර ජන සමාජයට නිදහසේ අතපය දිග හරින්නට අවස්ථාව උදාවූයේ මෙම කාලවකවානුවේදීය.

රටේ ජීවත්වන විවිධ ජන කොටස්වල සංස්කෘතික ප්‍රබෝධයක් ඇති වූයේ මේ කාලයේ දී.

වැඩවසම් ක්‍රමයේ ග්‍රහණයෙන් හා පීඩනයෙන් අපේ කෘෂිකර්මාන්තය මුදා ගැනීමට හැකි වුණේත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් නවීකරණයට ලක් කිරීමට හැකි වුණේත් මේ කාලවකවානුවේ දී. අපේ රටේ කාර්මික සංවර්ධනයක් ඇති වුණේත් මේ කාලයේදී ම යි. විද්‍යාව හා තාක්ෂණය උගන්වන්නට පටන් ගත්තේ එදායි. එම විද්‍යා හා තාක්ෂණික දැනුම අපේ ආර්ථිකයට උකහා ගැනීමටත් අවස්ථාව ලැබුණා. මෙය සමාජය ප්‍රතිනිර්මාණ කිරීමේ යුගයක් ලෙස හැඳින්වීම නිවරදියි.

මෙම යුගයේ සිටි දේශපාලඥයින්, දර්ශනවාදීන් හා චින්තකයින් නව ශ්‍රී ලංකාවක් හැඩ ගැස්වීමට උත්සාහ දරමින් සිටියා. කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, කෘෂිකර්මය හා වාරිමාර්ග යන ක්ෂේත්‍රයන්හි, පැරණි ලංකාව ලබාගෙන තිබූ ජයග්‍රහණ තහවුරු කළ හැකි හා ශක්තිමත් කළ හැකි මාර්ග ඔවුන් සොයා බැලුවා. ඔවුන් උනන්දුවක් දක්වූයේ බටහිර සංවර්ධනයේ හොඳම දෙය උකහා ගන්නා අතර, අපේ ජයග්‍රහණය ශක්තිමත් කළ හැකි ක්‍රම ගැනයි. උදාර වූ බෞද්ධ සම්ප්‍රදයන් මත පදනම් වුණු ජාතියක් ගොඩනැඟීමට ඔවුන් දේශපාලන වශයෙන් දැරුවේ ලොකු උත්සාහයක්. විවිධ වාර්ගික ජන කොටස් වලට හා ආගම් වලට අයත් ජනතාවක් වෙසෙන, එසේ ම විවිධ භාෂා කතා කරන ජන කොටස් සිටින දේශයක ඒ සියලුදෙනාට සමානාත්මතාවයෙන්, සමගියෙන් හා සහෝදරත්වයෙන් විසිය හැකි සමාජ ක්‍රමයක් ගොඩනැඟීමට ඔවුන් ප්‍රයත්න දැරුවා.

බෙදා පාලනය කිරීමේ පිළිවෙත ක්‍රියාත්මක වූ යටත් විජිත අතීතය හා බැඳුණු අපේ අපකීර්තිමත් උරුමය පිසදා හැර, අපේ කාලය හා ශක්තිය එකමුතු කොට සෞභාග්‍ය සඳහා අපට ඉදිරියට යා හැකි සමාජයක් එ මගින් ගොඩනගා ගත හැකි යැයි ඔවුන් කල්පනා කළා.

අප අතර පවතින පටු ගැටුම් හා වාද භේද වෙනුවෙන් අපේ සම්පත් නාස්ති කර දැමීමේ තත්ත්වය එ මගින් පිටුදැකිය හැකි යැයි ඔවුන් කල්පනා කළා. එහෙත් එක්සත් ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැඟීමේ මේ ව්‍යායාමය අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීමට අන්තවාදීන් දැරූ ප්‍රයත්නය සාර්ථක වුණා.

ඉන්පසු අපට හමුවුනේ 1977 සිට 1994 දක්වා 17 වසරක දීර්ඝ කාලයක් මුළුල්ලේ පැතිරී ගිය බිහිසුණු විනාශකාරී යුගයයි.

ඉන්පසු අපට හමුවුනේ 1977 සිට 1994 දක්වා 17 වසරක දීර්ඝ කාලයක් මුළුල්ලේ පැතිරී ගිය බිහිසුණු විනාශකාරී යුගයයි.

එය සියලුම යහපත් දෑ අවිචාරවත් ලෙස, කෲර හා අනුකම්පා විරහිත ලෙස විනාශ කළ යුගයයි. වසර

සුවකිරීමේ, සමාදානයේ හා ප්‍රතිනිර්මාණයේ
නව යුගය උදාවූයේ 1994 දී.

දහස් ගණනක් මුළුල්ලේ එ තරම් ශක්තිමත් ලෙස ගොඩනැගූ ශ්‍රී ලාංකීය ජාතිය දෙදරුම් කා විනාශ වී ගියේ එම යුගයේ දී. අපේ අධ්‍යාත්මය, අපේ දර්ශනික හා සංස්කෘතික උරුමය කර්කශ ලෙස විනාශ වුණේත් එම කාලයේ දී ම යි.

තුන් වන ලෝකයේ ඉතාමත් ම ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමයක් ලෙස මුළු මහත් ලෝකයේ ම ප්‍රසාදයට ලක් වී තිබූ අපේ දේශපාලන ක්‍රමය එද ඔවුන් සමච්චලයට හා අවමානයට ලක් කළා.

ඉතාමත් ශක්තිමත්ව, සංවිධානාත්මකව සහ විනිවිද පෙනෙන සුළු අයුරින් පැවති අපේ පාලන ක්‍රමය, තම හාම්පුතුන්ගේ අතිශයින්ම කුරිරු නියෝග වලට අනුව මිනී මරන්නට, සොරකම් කරන්නට හා බියෙන් දත නමන්නට හැඩ ගැස්සුනු සොරුන්ගේ සහ ගජ මිතුරන්ගේ හොර ගුහාවක් බවට පරිවර්තනය වුණේ මේ කාලයේ දීයි.

> ආඥාදායකයින් කිහිප දෙනකුගේ අධිකාරී බලය ඉදිරියේ, ශ්‍රේෂ්ට ජනතාවගේ නිර්මාණශීලිත්වය ඔවුන් එද මර්දනය කළා.

මෙහි ඵලවිපාක වශයෙන් ආර්ථිකයේ සියලු සංවර්ධනයන් නිශ්ප්‍රභ වූ බව අමුතුවෙන් කිවයුතු නැහැ.

ආඥාදායකයින් කිහිප දෙනකුගේ අධිකාරි බලය ඉදිරියේ, ශ්‍රේෂ්ට ජනතාවගේ නිර්මාණශීලිත්වය ඔවුන් එද මර්දනය කළා.

එද යමක් කරගැනීමට හැකි වුණේ හාම්පුතුන් කියන ලෙස දනින් වැටීමටත්, යාඥා කිරීමටත්, කොන්ද නැමීමටත් සුදනම් වූ එහෙයියන්ට පමණයි. ඒ සඳහා වුවත් සැහෙන යමක් කැප කරන්නට ඔවුන්ට සිදුවුණා.

සහෝදරයකු විසින් සහෝදරයකු මරා දමන ලබන, ජනතාව අතර ද, ජන කොටස් අතර මෙන් ම ජන කොටස් තුළ ද, වෘත්තීන් තුළ ද, ඇතැම් විට පවුල් තුළ ද අන්‍යොන්‍ය සැක සංකා හා බිය ජනිත කළ, ඉරිතලා බිඳී ගිය ජාතියක තුවාල සුව කිරීමේ හා එම තුවාල කැළැල් මකා දැමීමේ හදිසි කර්තව්‍ය භාර ගැනීමටයි එද අපට සිදු වුණේ. එද අපට උරුම වූයේ තුවාල වී ලේ ගලන ජාතියක්, දහස් ගණන් ජනතාව හඬා වැටෙන ජාතියක්.

මේ කර්තව්‍යය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමට නම් විවෘත මනසක් හා පුළුල් වූ හදවතක් ඇති නායකත්වයක් අවශ්‍ය වුණා. අප එම කාර්යය සපුරාලූ බව මගේ විශ්වාසයයි. අප අභියෝග භාරගත්තා. එසේම එම අභියෝග ජය ගත්තා.

සාමය හා සමගිය ඇති කිරීමේ ක්‍රියාදාමයේ දී අපේ ජාතිය තුළ සිටින විවිධ වූ ජන කොටස් යළි එකමුතු කිරීමත්, ඔවුන් සමගි කිරීමත් අවශ්‍යයි. ගැටුම්කාරී දේශපාලනය වෙනුවට, එකඟතාව මත කටයුතු කරන දේශපාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමටත් අපට අවශ්‍යයි. අපේ රජය දේශපාලන පක්ෂ හතකින් සමන්විතයි. පක්ෂ දෙකක් හැර පාර්ලිමේන්තුවේ සෙසු සියලු පක්ෂවල ක්‍රියාත්මක සහයෝගය අපට ලැබෙනවා. මේ යෝධ අභියෝගයට මුහුණ දීම සඳහා නව ස්වරූපයක නායකත්වයක් සමඟ නව සංකල්ප, නව කැපවීමක් මෙන්ම උදාර වූ හා මානව හිතවාදී වූ ආකල්පයක් බරපතළ ලෙස ම අවශ්‍ය වුණා. අපේ රටේ දීර්ඝ ඉතිහාසයේ දී නායකත්වයක් මුහුණ දුන් ඉතා ම බරපතළ වූ අභියෝගය මෙය විය හැකියි. මෙම කර්තව්‍ය මුදුන් පමුණුවා ගැනීමේ කාර්යයේ දී අප ක්‍රියාකොට ඇති ආකාරය විනිශ්චය කිරීමේ වගකීම මම ඔබටත් , මගේ ජනතාවටත් පවරනවා.

> නිදහසින් පසුව ගත වී ඇති පනස් වසරක කාලය තුළ ප්‍රථම වතාවට, බහුතර ජන කොට්ඨාශය වන සිංහල බෞද්ධයන්, නව දේශයක් ගොඩනැගීමේ සංකල්පයට දැඩි ලෙස කැපවී සිටී.

ඉතාමත් නිහතමානයෙන් යුතුව මේ අවස්ථාවේ දී මම එක් කරුණක් පමණක් සඳහන් කරන්න කැමැතියි. එනම්, අපේ නිදහසින් පසුව ගත වී ඇති පනස් වසරක කාලය තුළ ප්‍රථම වතාවට, බහුතර ජන කොට්ඨාශය වන සිංහල බෞද්ධයන්, නව දේශයක් ගොඩනැගීමේ සංකල්පයට දැඩි ලෙස කැපවී සිටින බවයි. සෑම ජන කොටසකට ම ආත්ම ගෞරවයෙන් යුතුව ජීවත්වීමටත් ඔවුන් සියලුදෙනාට සමාන අවස්ථා හිමිකර ගැනීමටත් ඉඩ ලැබෙන නව දේශයක් ගොඩ නැඟීමට ඔවුන් කැප වී සිටිනවා. බෙදී ගිය දේශයක් මුහුණ දී ඇති අර්බුදයට, එකම විසඳුම මෙය බව ඔවුන්ගේ විශ්වාසයයි.

එක්සත් ශ්‍රී ලංකාවක් පිළිබඳ ව දීර්ඝ කාලයක්

මුළුල්ලේ තමන් දුටු සිහිනය සැබෑ කර ගැනීමට නිදහසින් පසු ප්‍රථම වරට අවස්ථාව උදා වී ඇත්තේ දැන් යයි සුළු ජන කොටස් තුළ විශ්වාසයක් ඇති වී තිබෙනවා. ඊට හේතුව අප අනුගමනය කරන නිවැරදි ප්‍රතිපත්තියයි.

සෑම ජන කොටසකට ම සුවිශේෂ වූ ජාතික අනන්‍යතාව පිළිගැනීමට, ඇගයීමට හා ආරක්ෂා කිරීමට එ වැනි එක්සත් රාජ්‍යයකට හැකිවනු ඇති බව ඔවුන්ගේ විශ්වාශයයි.

අපේ රට ට ගැලවීමට ඇති එකම මාර්ගය ජාතිය ගොඩනැඟීමේ එක්සත් ප්‍රයත්නයක් බවට සියලුම ජන කොටස් අතර එලදයි අවබෝධයක් ප්‍රථම වරට ඇති වී තිබෙන්නේත් දැන්. උදා කර ගතහැකි ලක්ෂණ අනාගතයක් පිළිබඳ ව මේ ජන කොටස් අතර නව විශ්වාසයක් ගොඩනැඟී තිබෙනවා.

21 වන සියවස හා නව සහස්‍රයට ශ්‍රී ලංකාව රැ ගෙන යෑමේ වරප්‍රසාදයත්, වගකීමත් පැවරීමට, ඉරණම විසින් තෝරාගෙන ඇත්තේ මගේ රජයයි. 21 වන සියවස සඳහා අපේ දර්ශනය වන්නේ නව ශක්තිය.

> **21 වන සියවස හා නව සහස්‍රයට ශ්‍රී ලංකාව රැගෙන යෑමේ වරප්‍රසාදයත්, වගකීමත් පැවරීමට, ඉරණම විසින් තෝරාගෙන ඇත්තේ මගේ රජයයි.**

සමගිය හා සාමයේ යුගයක් කරා විශ්වාසවන්ත ලෙස සහ එකමුතුව ඉදිරියට ගමන් කරමු යන්නයි. මෙය ප්‍රබුද්ධත්වයේ හා නවීකරණයේ යුගයයි.

මෙම යුගයේ දී ප්‍රමුඛත්වය ලැබෙන්නේ අධ්‍යාපනයට. විද්‍යාව හා තාක්ෂණයට , විශේෂයෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයටයි. අපේ ගොවි ජනතාව හා කම්කරුවන්ට නූතන කෘෂිකාර්මික තාක්ෂණය ලැබෙනු ඇත්තේ මේ යුගයේ දී. ඔවුන්ගේ ශ්‍රමයට, කීර්තියක් හා ගෞරවයක් හිමිවන අතර ඔවුන්ට ලැබෙන ආදායම් සකස් වන්නේ ඔවුන්ගේ ඒ උදාර වෘත්තීන්ට ගැළපෙන ආකාරයටයි.

මානව හිතවාදී මුහුණුවරක් සහිත නිදහස් වෙළඳ පොළ ආර්ථික ක්‍රමයක් පිළිබඳ අපේ සංකල්පය පදනම්ව, සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාදමය අපි ශක්තිමත් කරන්නෙමු. අපේ ප්‍රතිපත්තිය තදින් ම මුල්

බැස ගෙන ඇත්තේ දේශීය සම්ප්‍රදායන්ගෙන් අපට උරුම වූ ඉතාම හොඳ දේ මතයි. එවැනි පදනමක පිහිටා නවීන හා සෞභාග්‍යමත් නව අනාගතයක් වෙත අප පිය නගන්නෙමු. නූතන තාක්ෂණය, කාර්යක්ෂම කළමණාකරණය, ශක්තිමත් මූල්‍ය පදනම වැනි නිදහස් වෙළඳ පොළ ආර්ථිකයේ වැදගත් අංශවලට අනුකූලව අපි ප්‍රතිපත්තියක් සකස් කර ගන්නෙමු. මෙය ගෝලීයකරණය ක්‍රියාදමයෙන් මතු කොට ඇති අභියෝග වලට කාර්යක්ෂම ලෙස මුහුණදීමට හැකි වන පැහැදිලි ප්‍රතිපත්තියකි.

අපේ සමාජයේ දුප්පත් කොටස් වලට නිදහස් වෙළඳ පොළ ආර්ථිකයෙන් ඇති වන පීඩාකාරී බලපෑම් අවම කිරිම සඳහා අපි අපේ සමාජ සුරක්ෂිත වැඩපිළිවෙළ ශක්තිමත් කරන්නෙමු. අපේ සමෘද්ධි වැඩ සටහන හා සෙසු සුභ සාධන වැඩ සටහන් ඉදිරියට ගෙන යන්නේ ඒ අනුවයි. අපේ කතා කරන මානව හිතවාදී මුහුණුවර එයයි.

රට පාලනය කිරීමේ හා පරිපාලනයේ නවීන ක්‍රමය සහ එහි විනිවිද පෙනෙන සුළුභාවය අපේ ආර්ථික හා සමාජ පුනර්ජීවනයේ පදනමයි.

ආර්ථිකයේ සැලැස්මාණුකූල සංවර්ධනය තව දුරටත් විධිමත් කෙරෙන අතර, එය වඩාත් ශක්තිමත් කෙරෙන ක්‍රමයක් බවට අපි පත් කරන්නෙමු.

එය මෙයට පස් වසරකට උඩ දී අප ආරම්භ කළ ජාතිය යළි ගොඩනැගීමේ ව්‍යායාමය තව දුරටත් ශක්තිමත් කරන යුගය වනවා නොඅනුමානයි. අපි නව ජාතියක් ගොඩ නගමු. එය නව ජීවනයේත් පුනරුදයේත් සතුට හා ප්‍රීතිය භුක්ති විඳින්නා වූ නව ජාතියකි. එය අපේ විවිධත්වයට ගරු කරන හා එය ආරක්ෂා කිරීමට කැපවන එසේ ම අප සියලු දෙනාට එකට එක්ව ගොඩනැගිය හැකි එකම එක ශ්‍රී ලාංකීය ජාතියකි. විවිධත්වය වෙනුවෙන් යුද්ධ කරනවා වෙනුවට එම විවිධත්වයෙන් අපි අපේ ශක්තිය ලබා ගන්නෙමු. අපේ රටේ නව සංවර්ධනය සඳහා අපේ තරුණ පරපුර

"රට පාලනය කිරීමේ හා පරිපාලනයේ නවීන ක්‍රමය සහ එහි විනිවිද පෙනෙන සුළුභාවය අපේ ආර්ථික හා සමාජ පුනර්ජීවනයේ පදනමයි."

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



තුළ ඇති ශක්තියත්, ඔවුන් තුළ ඇති අසීමිත කැපවීමත්, ඔවුන්ගේ නායකත්වයත් අපි උපයෝගී කර ගන්නෙමු. සොහොයුරන් එකමුතු කොට, සාමය ලඟා කර ගැනීමට හැකිවන පරිදි, පවතින ගැටුම් හා අවුල් වියවුල් මඩ ගොහොරුව මතින් දස ලක්‍ෂ සංඛ්‍යාත සුදු නෙළුම් පුපිපෙන බවට අපි සහතික වෙමු.

දහත් වසරකට පසු 1994 දී ඔබ සැම එක් වී ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් යුක්ත පොදු ජන එක්සත් පෙරමුණට අපේ ශ්‍රී ලංකාවේ පාලන බලය ලබා දෙන ලදී. පොදුජන එක්සත් පෙරමුණේ ජනාධිපති අපේක්ෂක වූ මට 62.28%ක ජනවරමක් ලබා දීමට එද ඔබ සමත් විය.

1994 දී අපි මේ රට භාරගන්නා විට මේ සියලු ප්‍රශ්න විසඳීමට අප තුළ පැහැදිලි දර්ශනයක් තිබුණි. අපි මේ දර්ශනය පටු දේශපාලන වාසි නොතකා එඩිතරව ජනතාව ඉදිරියේ තැබුවෙමු. ජනවාර්ගික ප්‍රශ්නය, ආර්ථික අර්බුදය, සමාජ අර්බුදය, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා මානව අයිතිවාසිකම් වැනි සංකීර්ණ ප්‍රශ්න පිළිබඳ අපේ දර්ශනය විටින් විට අප ඔබට ඉදිරිපත් කළෙමු.

> 1994 දී අපි මේ රට භාරගන්නා විට මේ සියලු ප්‍රශ්න විසඳීමට අප තුළ පැහැදිලි දර්ශනයක් තිබුණි. අපි මේ දර්ශනය පටු දේශපාලන වාසි නොතකා එඩිතරව ජනතාව ඉදිරියේ තැබුවෙමු.

අයාලයේ ගිය රටක් ජාවාරම් කරුවන්ගේ පාරාදීසයක් වී තිබූ ආර්ථිකයක්, ගත වූ පස් වසර තුළ පැහැදිලි සංවර්ධන මාවතකට ගෙන ඒමට අපට ශක්තිය දුන්නේ අපේ ඒ දර්ශනයයි.

මව්බිමේ උරුමය රකිමින්, ජාතියක් සාර්ථකව ගොඩ නැඟීම සඳහා වූ තීරණාත්මක මූලික අවශ්‍යතාවක් වශයෙන් සියලු දෙනා තේරුම් ගත් හා එකඟ වූ දර්ශනයක් තිබීම අත්‍යාවශ්‍යය. වසර දහස් ගණනක පෞඪ ඉතිහාසයක් හා උතුම් සංස්කෘතික උරුමයක් ඇති අපට අපේ ජාතික අනන්‍යතාව රකිමින් මේ දර්ශනය ක්‍රියාත්මක කළ යුතු විය.

දර්ශනයක් අද පවතින තත්ත්වයට වඩා අප රට උසස් හා වඩාත් ආකර්ශනීය තත්ත්වයකට පත් කිරීම සඳහා වූ මානසික චිත්‍රයක් වේ. අපි අපේ ශක්තීන්

හා ඉඩ ප්‍රස්තා උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින්, දුර්වලතා හා තර්ජන අවම කරමින්, මිනිසත් බවෙන් පිරිපුන් ජනතා ලෙන්ගතු, ප්‍රබුද්ධ වූ හා කාර්යක්ෂම රජයක් නිර්මාණය කිරිමට ශක්තිමත් වීමු.

දේශපාලන වශයෙන් අගතිගාමී වූත්, ආර්ථික වශයෙන් සහමුලින්ම වංචනික වූත්, සාමාජීය වශයෙන් හානිකර වූත්, ප්‍රජාතන්ත්‍ර විරෝධී වූත්, පරිපාලනමය වශයෙන් දූෂිත වූත්, රජයක් විසින් දහත් වසරක් පුරා අපේ මාතෘ භූමියට, අපේ සදාචාරයට හා සාර ධර්ම වලට කර තිබූ අතිමහත් ව්‍යසනය අවසන් කරමින් අද අපි සදචාර සම්පන්න ප්‍රජාතන්ත්‍රිය තිරසාර සංවර්ධන මාවතක් ඔස්සේ සමාදනය, සාමය හා සමෘද්ධිය කරා ඉදිරියට ගමන් කරමින් සිටිමු.

මේ කාලය තුළ අපි බොහෝ දේ කළෙමු. නොකළ දේ ඇති බව ද අපි දනිමු. අප අපගේ ඉලක්කය ජයගත් තැන් බොහෝය. වැරදුනු තැන් ද ඇත. තවත් බොහෝ දේ අපි කරමින් සිටිමු. සමහර දේ කිරිමට සූදානම් වෙමින් සිටිමු.

ගත වූ පස් වසර තුළ අප කළ ප්‍රධාන කාර්යයන් කිහිපයක් දන් මම ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වෙමි.

1. මිනිස් නිදහස, අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කිරිම: දහත් වසරකට පසු අපට බලය ලබා දුන් ජනතාව බලාපොරොත්තු වූ සැකෙන් බියෙන් තොර ව ජිවත් වීමේ අයිතිය අප තහවුරු කර ඇත. අතුරුදහන් වීම් අවසන් කර ඇත. රටෙහි ඕනෑම පුද්ගලයකුට නිදහසේ කථා කරන්න, ලියන්න, විවේචනය කරන්න ඇති අයිතිය අද අප සහතික කර දී ඇත. ඒ නිදහස පාවිච්චි කරමින් නීතිය මෙන් ම සදචාරාත්මක සම්ප්‍රදයන් නොසලකා කෙරෙන නින්දනිය වූත්, අමානුෂික වූත්, නිර්මාණාත්මක අසත්‍යයන්ගෙන් අද මමත්, අපේ රජයත් පහරකමින් සිටිමු. ඒ අපේ විපක්ෂය අප සහතික කළ නිදහස පාවිච්චි කරන ආකාරයයි. ඒත් අපි හෙටත් අපේ නිදහස නැති වුණත්, ඔබේ නිදහස සුරැකීමට කැපවන්නෙමු.

> **අද අපි සදචාර සම්පන්න ප්‍රජාතන්ත්‍රිය තිරසාර සංවර්ධන මාවතක් ඔස්සේ සමාදනය, සාමය හා සමෘද්ධිය කරා ඉදිරියට ගමන් කරමින් සිටිමු.**

2. පාර්ලිමේන්තුවේ එක් වැඩි ඡන්දයක් ඇතිව අමාරුවෙන් පිහිට වූ මෙම රජය තීරණාත්මක සෑම අවස්ථාවකම විවිධ මත, ජාති, ආගම් නියෝජනය කරන පක්ෂ 12ක සහාය ලබා ගනිමින් රටට අවශ්‍ය දේශපාලන ස්ථාවරත්වය ගොඩනගා ඇත.

3. අපි බලයට පත්වන විට ලෝක ප්‍රජාව ශ්‍රී ලාංකිකයින්ට එරෙහි බොහෝ දුරට කොටි ත්‍රස්තවාදීන්ට පක්ෂපාතී මතයකට නැඹුරුව සිටියහ. ලෝකය අප දෙස බැලුවේ සුළු ජාතිකයින්ට එරෙහිව අමානුෂිකව කටයුතු කරන මිලේච්ඡ ජන කොට්ඨාශයක් ලෙසය. ගත වූ පස් වසර තුළ අප මේ තත්ත්වය සහමුලින් වෙනස් කර ඇත. විනාශ කර තිබූ ශ්‍රී ලාංකික අභිමානවත් ප්‍රතිරූප අපි අද යළි ස්ථාපනය කර ඇත්තෙමු.

**ආර්ථික වශයෙන් අප කළ දේ මෙසේය :**

එළඹෙන සියවසේ අභියෝග වලට මුහුණ දිය හැකි වන පරිදි පැහැදිලි ඉදිරි දැක්මක් ඇතිව 1994 දී අප විසින් ආරම්භ කළ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රමුඛතාව දෙනු ලැබුයේ ආර්ථිකයේ මූලිකාංග ශක්තිමත් කර ගනිමින් තිරසාර සංවර්ධන ක්‍රියාවලියකට අඩිතාලම දැමීමයි.

* එහි මුල් පියවර වූයේ කලක් තිස්සේ නොසැලකිලිමත් ලෙස පවත්වා ගෙන ගිය අයවැය හිඟය ඔරොත්තු දිය හැකි මට්ටමකට පහත හෙළීමට කටයුතු කිරීමයි. නාස්තිකාර වියදම් කපා හැර ඥාණාන්විත ලෙස රාජ්‍ය වියදම් හැසිරවීමටත් විනිවිද පෙනෙන ලෙස ආර්ථිකය කළමණාකරණය කිරීමටත්, ප්‍රමුඛත්වය දෙන ලදී. කලක් තිස්සේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 13%ක තරම් ඉහළ මට්ටමක පැවති අයවැය හිඟය දැන් 8% දක්වා පහත් හෙළීමට සමත් ව සිටිමු. මෙම පියවරට සමගාමීව අපේ මූල්‍ය ප්‍රතිපත්තිය මෙන්ම විදේශ විනිමය ප්‍රතිපත්තිය ද නම්‍යශීලී ලෙසත්, බුද්ධිමත් ලෙසත් පවත්වා ගෙන ගියෙමු. 13%- 15% මට්ටමක පැවති උද්ධමන වේගය 9% දක්වා ත්, 19%ට අධික ව පැවති පොලී අනුපාතිකය 12% - 18%ක

"විවේචනය කරන්න ඇති අයිතිය අද අප සහතික කර දී ඇත. ඒ නිදහස පාවිච්චි කරමින් නීතිය මෙන් ම සදාචාරාත්මක සම්ප්‍රදායන් නොසලකා කෙරෙන නින්දනීය වූත්, අමානුෂික වූත්, නිර්මාණාත්මක අසත්‍යයන්ගෙන් අද මමත්, අපේ රජයත් පහරකමින් සිටිමු.

අපි බලයට පත්වන විට ලෝක ප්‍රජාව ශ්‍රී ලාංකිකයින්ට එරෙහි බොහෝ දුරට කොටි ත්‍රස්තවාදීන්ට පක්ෂපාතී මතයකට නැඹුරුව සිටියහ."

මට්ටමක් දක්වා ත් අඩුකර ගැනීමත්, ආර්ථික වශයෙන් අප ලද විශේෂ ජයග්‍රහණය වේ. එ පමණක් නොව, අපේ .අපනයන දිරිමත් වන අන්දමේ විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීමටත්, විදේශ වත්කම් ඩොලර් මිලියන 2500 මට්ටමක අඛණ්ඩව පවත්වා ගැනීමටත් අපි සමත් වූයෙමු.

අලුතින් ඉස්මතු වන ආර්ථික යථාර්ථයන්ට හා ගෝලීය වෙළඳ පළ බලවේගවලට අනුකූලවෙමින් හා සාධාරණ රාජ්‍ය පාලන තන්ත්‍රයක් පවත්වාගනිමින් රජය ආර්ථික කටයුතු වලට සම්බන්ධවීමේ ක්‍රියාවලියක් අපේ ආර්ථික පිළිවෙතින් හඳුන්වා දුනිමු.

* මේ අනුව ස්ථාවර ආර්ථික සංවර්ධනයක් ඉලක්ක කර ගනිමින් අපේ ආර්ථික ක්‍රියාවලිය ක්‍රමානුකූලව හැඩ ගැසුවෙමු..

* මැනවින් සැලසුම් කළ මැදි කාලීන ප්‍රතිපත්ති රාමුවක් තුළ වෙළඳ පොළ බලවේග වලට අනුකූලව ක්‍රියාත්මක වන එහෙත් ජනතා අවශ්‍යතාවලට අවශ්‍ය වන පරිදිත් වෙළඳ පළ ආර්ථික ක්‍රමයේ ක්‍රියාත්මක දුර්වලතාවන් අවම කළ හැකි පරිදිත්, කියියම් මෙහෙයවීමකට නතු කළ හැකි ආර්ථික පිළිවෙතක් අපි අනුගමනය කළෙමු.

* ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය වන මහා මාර්ග, විදුලිය බල හා දුරකථන සේවා වාරිමාර්ග වැනි යටිතල පහසුකම් සංවර්ධන කිරිම සඳහා ප්‍රමුඛත්වයක් දෙන ලදී.

* කලක් තිස්සේ පහත වැටී තිබුනු රාජ්‍ය ආයෝජන ක්‍රමවත් කිරීමත්, පුද්ගලික අංශය ආර්ථික කටයුතු කෙරෙහි උපරිම ලෙස සහභාගී කරවා ගැනීමත්, අපේ උපාය මාර්ගය විය.

* අපේ පෞද්ගලිකරණ වැඩ පිළිවෙළ, මින් පෙර පැවති ආකාරයේ රාජ්‍ය ව්‍යවසාය විනාශකාරී පොදු දේපළ විකිණීමේ වැඩ පිළිවෙළක් නොවීය. අපේ ආර්ථිකයේ ප්‍රමුඛතා අංශ කෙරෙහි ප්‍රාග්ධනයෙන් පමණක් නොව, නව තාක්ෂණය හා කළමණාකරණ

**දළ දේශීය නිෂ්පාදිතයෙන් 13%ක තරම් ඉහළ මට්ටමක පැවති අයවැය හිඟය දැන් 8% දක්වා පහත හෙළීමට සමත් ව සිටිමු.**

**13%- 15% මට්ටමක පැවති උද්ධමන වේගය 9% දක්වා ත්, 19%ට අධික ව පැවති පොලී අනුපාතිකය 12% - 18%ක මට්ටමක් දක්වාත් අඩුකර ගැනීමත්, ආර්ථික වශයෙන් අප ලද විශේෂ ජයග්‍රහණය වේ.**

**විදේශ වත්කම් ඩොලර් මිලියන 2500 මට්ටමක අඛණ්ඩව පවත්වා ගැනීමටත් අපි සමත් වුයෙමු.**

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

**අපේ පෞද්ගලීකරණ වැඩ පිළිවෙළ, මින් පෙර පැවති ආකාරයේ රාජ්‍ය ව්‍යවසාය විනාශකාරී පොදු දේපළ විකිණීමේ වැඩ පිළිවෙළක් නොවිය.**

**ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ මහජනතාවට ලැබෙන තෙක්, සමාජයේ දිළිඳු ජන කොටස් වලට සහන සැලසීම සඳහා දිළිඳුකම තුරන් කරලීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී.**

**ශක්තිමත් හා ක්‍රියාශීලී පෞද්ගලික අංශයක් නිර්මාණය කිරීම සඳහා දිරි ගැන්වීම් මාලාවක් සැපයුවෙමු.**

නිපුණතා වලින් ද දායක විය හැකි, ශක්තිමත් අයෝජකයින් ඇද ගැනීම එම වැඩ පිළිවෙළේ අරමුණ විය. විශේෂයෙන්ම වතු වැවිලි අංශය, දුරකථන සේවා, ගෑස් සැපයුම, ගුවන් සේවා, විදුලිය සහ වරාය වැනි සේවාවන්හි රාජ්‍ය අංශයේ පුළුල් අයිතිය රැක ගනිමින්ම, එම ව්‍යාපාර නියාමන පාලනයකට නතු කිරීම ද එහි විශේෂ ලක්ෂණයයි. රාජ්‍ය ව්‍යාපාර කෙරෙහි මෙන් ම වෙනත් ආර්ථික කටයුතු කෙරෙහි විදේශීය අයෝජකයින් ඇද ගැනීමට අප සමත් වූයේ අපේ ආර්ථික ප්‍රතිපත්තිවල විශ්වාසනීයභාවය තුළිනි.

* ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ මහජනතාවට ලැබෙන තෙක්, සමාජයේ දිළිඳු ජන කොටස් වලට සහන සැලසීම සඳහා දිළිඳුකම තුරන් කරලීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී. ජනතාව වෙත සහනාධාර ලැබෙන විවිධ වැඩ පිළිවෙළවල් ඒකාබද්ධ කිරීම තුළිනුත්, ඒවා සහන ලැබිය යුතු ජන කොටස් කෙරෙහි ඉලක්ක කිරීම තුළිනුත්, මෙම අරමුණු ඉටු කිරීම සඳහා සමෘද්ධි ව්‍යාපාරය අරඹන ලදී. දිළිඳු ජන කොටස් ඉලක්ක කරගෙන, දිළිඳුකම තුරන් කරලීමේ විශේෂ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන අතරතුර දී, අඩු ආදයම් ලාභීන්ගේ ආර්ථික කටයුතු, ආයෝජන හා රැකී රක්ෂා අවස්ථා ඉහළ නැංවීමේ අරමුණු විය.

* ශක්තිමත් හා ක්‍රියාශීලී පෞද්ගලික අංශයක් නිර්මාණය කිරීම සඳහා දිරි ගැන්වීම් මාලාවක් සැපයුවෙමු. ඉතිරිකිරීම් හා ආයෝජන දිරි ගැන්වීම සඳහා බදු අඩු කළෙමු. කාර්මික නිෂ්පාදන විවිධාංගීකරණය සඳහා විවිධ බදු සහන සහ දිරිගැන්වීමේ දීමනා ලබා දුනිමු. මේ හේතුවෙන් ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ, පරිගණක මෘදුකාංග, සිමෙන්ති, වානේ සහ වෙනත් කර්මාන්ත සඳහා වූ අයෝජන ඉහළ යාමත්, පොදුවේ කර්මාන්ත විවිධාංගීකරණය වීමත්, ගත වූ පස් වසර තුළ දී දක්නට ලැබිණි. අපේ තරුණ පරපුර පරිගණක අංශයට හා තොරතුරු තාක්ෂණය කෙරෙහි යොමු වීම ගැන අපි සතුටු වෙමු.

**1994 දී 12.1% ක්වූ විරැකියා ප්‍රශ්නය 1998 වන විට 9.1% ක් දක්වා අඩු කිරීම.**

**1994 දී රු. 32,414/-ක් වූ ඒක පුද්ගල ආදායම 1998 වන විට රු. 54,035/-ක් දක්වා වැඩි කිරීම.**

**දළ දේශීය නිෂ්පාදනය 1994 දී රුපියල් කෝටි 57,900/-ක් වූ අතර, 1998 වන විට රුපියල් කෝටි 115,000/-ක් දක්වා වැඩි කිරීම.**

1. 1994 දී රු. 32,414/-ක් වූ ඒක පුද්ගල ආදායම 1998 වන විට රු. 54,035/-ක් දක්වා වැඩි කිරීම.

2. 1994 දී 12.1% ක්වූ විරැකියා ප්‍රශ්නය 1998 වන විට 9.1% ක් දක්වා අඩු කිරීම.

3. දේශීය ඉතිරිකිරීම් 17% සිට 23% දක්වා වැඩි කර ගැනීම.

4. 1994 දී රුපියල් කෝටි 57,600/-ක් වූ දළ ජාතික නිෂ්පාදනය 1998 වන විට රුපියල් කෝටි 99,800/-ක් දක්වා වැඩි කිරීම.

5. දළ දේශීය නිෂ්පාදනය 1994 දී රුපියල් කෝටි 57,900/-ක් වූ අතර, 1998 වන විට රුපියල් කෝටි 115,000/-ක් දක්වා වැඩි කිරීම.

6. පසුගිය වර්ෂ පහ තුළ වැඩිකරගත් නිෂ්පාදන වර්ග කිහිපයක් මෙසේය.

| | 1994 රුපියල් මිලියන | 1998 රුපියල් මිලියන |
|---|---|---|
| * කෘෂි නිෂ්පාදන | 98,519 | 153,335 |
| * වී නිෂ්පාදන | 21,241 | 26,842 |
| * අතිකුත් කෘෂි භෝග (තේ, පොල්, රබර් හැර) | 58,047 | 94,010 |
| * වන සම්පත් නිෂ්පාදනය | 11475 | 15669 |
| * ධීවර නිෂ්පාදන | 14373 | 23661 |
| * පතල් හා ආකර නිෂ්පාදන | 10473 | 17433 |
| * කෘෂි අංශයේ මුලු නිෂ්පාදනය | 80482 | 151,007 |
| * කර්මාන්ත ශාලා නිෂ්පාදනය | 64174 | 116,568 |
| * ඉදිකිරීම් අංශයේ මුලු අගය | 38323 | 69,301 |
| * විදුලි, ගෑස් ජලය හා සනීපාරක්ෂක සේවා | 7727 | 13660 |
| * ගබඩා පරිවහන හා සන්නිවේදන | 52591 | 101620 |
| * බැංකු රක්ෂණ හා නිවාස | 35617 | 69267 |

1997 වන විට අපේ රටේ ආර්ථික සංවර්ධන වේගය 6.3% දක්වා ඉහළ නැංවීමට අප සමත්විය.

පසුගිය වසර තුළ ලෝක ආර්ථික සංවර්ධන වේගය 4.7% සිට 2.5% දක්වා අඩුවිය.

අපි 1998 අපගේ ආර්ථික සංවර්ධන වේගය 4.7% ක මට්ටමක තබා ගැනීමට සමත්විය.

1994 වන විට අපේ ග්‍රාමීය ජනතාවගෙන් විදුලිය පාවිච්චි කළේ 36% පමණි. අද එය 51% දක්වා වැඩි වී ඇත.

| | | |
|---|---|---|
| * දුරකථන (ඒකක) | 180724 | 455598 |
| * නව දුරකථන මාර්ග | 25322 | 143075 |

7. 1997 වන විට අපේ රටේ ආර්ථික සංවර්ධන වේගය 6.3% දක්වා ඉහළ නැංවීමට අප සමත්විය. මේ තත්ත්වය අප ළඟා කර ගත්තේ අපේ යුධ වියදම් හා අලාභය නොකඩවා රාජ්‍ය ආදායමට වඩා වැඩි මට්ටමක තිබිය දී ය. එහෙත් පසුගිය වසර තුළ ලෝක ආර්ථික සංවර්ධන වේගය 4.7% සිට 2.5% දක්වා අඩුවිය. ආසියාවේ සෑම සංවර්ධිත රටක ම ආර්ථික සංවර්ධන වේගය අවපාතයකට ලක්විය. ඒ සියල්ල මැද අපි 1998 අපගේ ආර්ථික සංවර්ධන වේගය 4.7% ක මට්ටමක තබා ගැනීමට සමත්විය.

8. 1994 වන විට අපේ ග්‍රාමීය ජනතාවගෙන් විදුලිය පාවිච්චි කළේ 36% පමණි. අද එය 51% දක්වා වැඩි වී ඇත. ලබන වසර වන විට මේ ප්‍රමාණය 70% දක්වා වැඩි කිරීමට අප කටයුතු කරමින් සිටී.

1994 වන විට විදුලි උත්පාදනයෙන් 80% ක් ජල විදුලිය මත රඳා තිබුණි. අද එය 75% දක්වා අඩුකර ඇත.

10. අපි බලයට පත්වන විට මේ රටේ ගෑස් පාවිච්චි කළේ පවුල් ලක්ෂ 03ක් පමණි. අද එය ලක්ෂ 07 දක්වා වැඩි කර ඇත. ලබන වසර වන විට ලක්ෂ 10 ඉක්මවනු ඇත.

11. 1994 දී 181,000ක් වූ මුළු දුරකථන ප්‍රමාණය මේ වන විට 500, 000ක් දක්වා වැඩි කිරීම.

12. 1994 සිට විදේශීය වත්කම් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 3,000 ක මට්ටමේ අඛණ්ඩව පවත්වා ගැනීම.

අපගේ ආර්ථික ජයග්‍රහණ මේ ආකාරයට සිදු කරගන්නට හැකි වුණේ ආර්ථික වශයෙන් මහා විනාශකාරී යුද්ධයක් මේ වසර 5න් 4ක් තුළම පවත්වාගෙන යමින් බව නැවත සඳහන් කරන්නට කැමතියි.

**1994 දී 181,000ක් වූ මුළු දුරකථන ප්‍රමාණය මේ වන විට 500, 000ක් දක්වා වැඩි කිරීම.**

**1994 දී 14.4% ක්ව තිබූ විරැකියාව 1998 වන විට 9.1% ක් දක්වා අඩු කිරීමට අප සමත් විය.**

**1994 ට පෙර මෙරට සහනාධාර වෙනුවෙන් වැය කළ මුදල වසරකට රුපියල් ලක්ෂ 40,000ක් පමණ විය. අපේ රජය යටතේ අද සමෘද්ධි සහනාධාර වශයෙන් වසරකට රුපියල් ලක්ෂ 85,000ක් පමණ වැය කරයි.**

1. 1994 දී 14.4% ක්ව තිබූ විරැකියාව 1998 වන විට 9.1% ක් දක්වා අඩු කිරීමට අප සමත් විය. අප බලය ලබාගන්නා විට වාර්තා වී ඇති විරැකියාව ලක්ෂ 8 ක්වූ අතර නව රජය බලයට පත්වීමත් සමග රැකියා පිළිබඳ බලාපොරොත්තු අත්හැර තිබූ තවත් ලක්ෂ 3ක පිරිසක් ඒ පෝලිමට එකතු විය. එනම් ලක්ෂ 4ක් විරැකියාවෙන් පසුවිය. මේ අතර ගත වූ පස් වසර තුළ වාර්ෂිකව ශ්‍රම හමුදාවට තවත් ලක්ෂ 04ක් පමණ පිරිසක් අළුතින් මේ ප්‍රමාණයට එක්විය. ඒ සියලු තත්ත්වයන් යටතේ විරැකියාව අද වන විට ලක්ෂ 6ක් දක්වා අඩු කිරීමට අප සමත් වී ඇත.

2. ගත වූ වසර පහ තුළ සියලුම රජයේ සේවකයින්ගේ වැටුප් 50%කින් වැඩිකිරිම.

3. 1994 ට පෙර මෙරට සහනාධාර වෙනුවෙන් වැය කළ මුදල වසරකට රුපියල් ලක්ෂ 40,000ක් පමණ විය. අපේ රජය යටතේ අද සමෘද්ධි සහනාධාර වශයෙන් වසරකට රුපියල් ලක්ෂ 85,000ක් පමණ වැය කරයි. විනාශකාරී යුද්ධයක් සමඟ දවැන්ත ආර්ථික සංවර්ධනයක් කරා රට යොමු කරමින් සිටින අපි මේ රටේ අඩු ආදයම් ලබන ජනතාවට එලදයි සමාජ ආරක්ෂණ ජාලයක් සමෘද්ධි වැඩ සටහන යටතේ ආරම්භ කර ඇත. දුප්පතුන්ට ප්‍රාග්ධන ශක්තිය ලබාදීම සඳහා රට පුරා සමෘද්ධි බැංකු 1000ක් ඇති කිරීම.

4. දුම්වැටි, මත්ද්‍රව්‍ය, මත්කුඩු, සමාජ අපචාර, සියදිවි හානි කරගැනීම් වැනි සමාජ ව්‍යවසනයන් අවමකිරීම සඳහා රාජ්‍ය මට්ටමින් ශක්තිමත් වැඩපිළිවෙළක් දියත් කිරිම.

5. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සංස්කෘතික මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ වැඩසටහනක් ඇති කිරීම හා කොළඹ අංග සම්පූර්ණ සංස්කෘතික සංකීර්ණයක් ආරම්භ කිරීමේ මූලික වැඩ කටයුතු අවසන් කිරිම.

ජනාධිපති කාර්යාලය
පු‍ස්තකාලය



**තරුණ කටයුතු :**

1. සර්ව ශක්තීන්ගෙන් යුත් තරුණයකු බිහි කිරීමේ නව සංකල්පය මත වත්මන් තරුණයින්ට ආර්ථික ශක්තිය, ශාරීරික හා මානසික ශක්තිය, දේශපාලන ශක්තිය, සමාජ ශක්තිය හා සංස්කෘතික ශක්තිය ලබාදීමේ නව වැඩ සටහන් ගණනාවක් තුළට තරුණයන් ගොනු කිරීම.

2. ස්වයං රැකියා සහ වෘත්තීය පුහුණු සඳහා තරුණයන් යොමු කිරීම.

3. සහජ ශක්තියෙන් සහ විශේෂ කුශලතා ඇති දරුවන්ට ඒවා වර්ධනය කර ගැනීමටත්, ඒවාට නිසි තියම තැන හිමි කරදීමටත්, විශේෂ තරුණ වැඩ සටහන් ආරම්භ කිරීම.

4. ලෝකයේ පළමු වතාවට දුගී දුප්පත්කම නැති කිරීමේ සංවර්ධන වැඩ සටහනක් තරුණ වැඩ සටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම.

5. ක්‍රීඩා පහසුකම්, තරුණ මධ්‍යස්ථාන හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන විශාල වශයෙන් ඇති කිරීම.

1. 21 වන ශත වර්ෂයට ගැළපෙන නවීන වූත්, විද්‍යාත්මක වූත් නව අධ්‍යාපන ප්‍රතිපත්තියක් ආරම්භ කිරීම.

2. රටේ ආර්ථිකයට ගැළපෙන වෘත්තිකයන් බිහි කිරීම මූලික කර ගත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම.

3. අධ්‍යාපන පහසුකම් වැඩි කිරීමේ ජාතික ව්‍යාපෘතියක් ඇති කිරීම.

4. අළුතින් විශ්ව විද්‍යාල 04ක් ඇති කිරීම. තවත් කිහිපයක් ඇති කිරීමට කටයුතු කරමින් පවතිනවා.

5. සියලු ගුරුවරු වර්ෂ කීපයක් තුළ පුහුණු විශේෂඥ ගුරුවරුන් බවට පත් කිරීමේ වැඩ සටහනක් ආරම්භ කිරීම.

**"ජනවාර්ගික ප්‍රශ්නය දඩමීමා කරගෙන දේශපාලන වාසි ගන්න ප්‍රතිපත්තිය 1994 බලයට පත් වූ අපි අවසන් කළෙමු.**

**මේ වන විට කොටි ත්‍රස්තවාදීන් අල්ලා ගෙන සිටි ප්‍රදේශවලින් 80% ක් නිදහස් කිරීම."**

ජනාධිපති ලේකම් කාර්යාලය
16 DEC 20..
පුස්තකාලය

> “අළුතින් විශ්ව විද්‍යාල 04ක් ඇති කිරීම. තවත් කිහිපයක් ඇති කිරීමට කටයුතු කරමින් පවතිනවා.”

> “මාර්ග, වාරිමාර්ග නිවාස, ධීවර සංවර්ධන කටයුතු සඳහා අපි ගත වූ පස් අවුරුද්දේ පසුගිය රජයට වඩා විශාල මුදලක් වැය කර ඇති”

**අධ්‍යාපන කටයුතු :**

මාර්ග සංවර්ධන කටයුතු, වාරිමාර්ග සංවර්ධන කටයුතු, නිවාස සංවර්ධන කටයුතු, ධීවර සංවර්ධන කටයුතු සඳහා අපි ගත වූ පස් අවුරුද්දේ පසුගිය රජයට වඩා විශාල මුදලක් වැය කර ඇති බව සියලු දෙනා දන්නා කරුණකි.

ඒ වගේ ම අප රටේ ජනගහනයෙන් හරි අඩක් තවමත් යෙදී සිටින කෘෂි කර්මාන්ත නවීකරණය කරමින් එයින් ආදායම් ලබන ගොවි ජනතාවට නවීන පහසුකම් ලබාදෙමින් හොඳ ආදයමක් ලබාගෙන අප රට මූලික කෘෂිබෝග වලින් ස්වයංපෝෂිත කර පාරිභෝගිකයින්ට ඒවා අඩු මුදලකට ලබාදෙන අතර, ගොවීන්ට වැඩි ආදයමක් ලබාදීමෙන් ඵලදායිතාව වැඩි කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කර ඇත.

රටක සංවර්ධනය වේගවත් කිරීමට ඒ සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් (යටිතළ පහසුකම් සංවර්ධන) වහාම ඇති කිරිම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා ගත වූ වසර පහ තුළ අපි ප්‍රධාන අවධානයක් යොමු කර කටයුතු කළ බව කවුරුත් දන්නා කරුණකි.

අපි බලයට පත් වූ විට පසුගිය රජය විසින් අනුමත කරගත් හෝ කිරීමට සූදනම් වූ මහා පරිමාණ ව්‍යාපෘති කිසිවක් තිබුණේ නැත. එහෙත් රටේ ශීඝ්‍ර සංවර්ධනයකට කටුනායක ගුවන් තොටුපොළ පුළුල් කිරිම, අතුරු ගුවන් තොටුපලවල් කිහිපයක් ඇති කිරිම. කොළඹ වරාය දකුණු ආසියාවේ විශාලතම වරාය ලෙස සංවර්ධනය කිරිම, ගාල්ල හා හම්බන්තොට වරායවල් අලුතින් නිර්මාණය කිරිම, කොළඹ - දකුණු කොළඹ - නුවර, කොළඹ- කටුනායක අධිවේගී මාර්ග ඇති කිරිම වැනි මහා පරිමාණ ව්‍යාපෘති ඇති කිරිම අත්‍යවශ්‍යය. මෙවැනි ව්‍යාපෘතියක් අප වැනි රටක ඇති කිරිමට විදේශ ආධාර අවශ්‍යය. එම නිසා එවැනි ව්‍යාපෘතියක මූලික කටයුතු අවසන් කිරිමට අවම වශයෙන් වසර 03ක කාලයක් වත් ගත වේ. ගත වූ පස් වසර කාලය තුළ අපි ඉහත සියලු ව්‍යාපෘති ආරම්භ කිරිමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කර ඇත. කටුනායක ගුවන් තොටුපොල පුළුල් කිරීම,

කොළඹ - දකුණු
කොළඹ - නුවර, කොළඹ-
කටුනායක අධිවේගී මාර්ග
ඇති කිරීම වැනි මහා
පරිමාණ ව්‍යාපෘති
ඇති කිරීම
අත්‍යවශ්‍යය.

කටුනායක ගුවන් තොටුපොල
පුළුල් කිරීම, කොළඹ වරාය
සංවර්ධනය කිරීම, කොළඹ -
දකුණු, කොළඹ කටුනායක
අධිවේගී මාර්ගය
දැනට මත් ආරම්භ
කර ඇත.

45 වසරක ආර්ථික
වරදක් හා 25 වසරක
අධ්‍යාපන වරදක් වසර
05 කින් නිවැරැදි කළ
නොහැක.



කොළඹ වරාය සංවර්ධනය කිරීම, කොළඹ - දකුණු, කොළඹ කටුනායක අධිවේගී මාර්ගය දැනට මත් ආරම්භ කර ඇත.

45 වසරක ආර්ථික වරදක් හා 25 වසරක අධ්‍යාපන වරදක් වසර 05කින් නිවැරැදි කළ නොහැක. එහෙත් පොදුජන එක්සත් පෙරමුණේ අපි වරද හරිහැටි තේරුම් ගෙන ඇත්තෙමු. වරද නිවැරදි කිරීමට ද අවශ්‍ය කටයුතු කර ඇත්තෙමු. නව සහශ්‍රය හා 21 වැනි සියවසට අපි සූදානම් වෙමින් සිටිමු.

දැන් මම අප ඉදිරියේ කිරීමට ඇති ප්‍රධාන කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නෙමි.

1. වත්මන් ජනාධිපති ක්‍රමය අහෝසි කර බලය විමධ්‍යගත වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ක්‍රියාත්මක කිරීම.

2. යුද්ධය හා ජනවාර්ගික ප්‍රශ්නය සහමුලින් නැති කිරීම.

3. රැකියා උත්පාදනය තවතවත් වේගවත් කිරීම.

4. පැහැදිලි දර්ශනයක් සැලසුම් හා ඉලක්ක මත පිහිටා ආර්ථිකය හා පරිපාලනය කාර්යක්ෂමව කිරීම සඳහා අපි ඇති කළ නිර්මාණාත්මක උපාය මාර්ග සංවර්ධනය හා ව්‍යුහාත්මක වෙනස්කම් තව දුරටත් වේගවත් කිරීම.

5. පෞද්ගලික අංශයේ ඇති බාධා තව දුරටත් ඉවත් කිරීම.

6. කෘෂිකර්මාන්තයේ ඇති ඇතැම් පසුබෑසීම් වැළැක්වීම.

7. වී, අල, ළූණු, මිරිස් හා කිරි ගොවියා මුහුණ දෙන ප්‍රශ්න වලින් ඔවුන් මුදවා ගැනීම.

8. නවීන කර්මාන්ත සංවර්ධන ක්‍රියාදාමයට හා ගෝලීයකරණයට ගැළපෙන අයුරින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම.

9. මාර්ග හා ප්‍රවාහණ ප්‍රශ්න විසඳීමට අප ක්ෂණික,

මධ්‍යකාලීන හා දිගුකාලීන වැඩසටහන් සැලසුම් කර ආරම්භ කර ඇතත්, මේ අංශයේ තවමත් ඇති බැරෑරුම් ගැටලු අවසන් කිරීම.

තව දින 132 කින් අපි වසර 2000න් ඇරඹෙන සහශ්‍රයට පා නහමු.

පසුගිය සහශ්‍රය තුළ මිනිසාගේ ශ්‍රේෂ්ඨතම නිර්මාණයක් බිහිවිය. එමෙන්ම ඔහු සිය වාස භූමියට කළ හැකි සියලුම හතුරුකම් හා අපරාධ සිදුකර හමාරය. මේ නිර්මාණ මිනිසාගේ සැප සම්පත් හා බලය වෙනුවෙන් සීමාවක් නැතිව යෙදවීම නිසා ද, ජාතිය හා ජාත්‍යන්තර ගැටුම් ද මේ අපරාධයේ වග උත්තරකරුවන් ද වී ඇත.

ලෝකයේ මහා බලවතුන් ද, අප වැනි කුඩා රටවල මිනිසුන් ද, අඩුවැඩි වශයෙන් මේ අපරාධයේ වගකීම භාරගත යුතුය. අපි අපේ මහ පොළොව සෝදාපාළු කර දමා ඇත. වාතය, ජලය, අපිරිසිදු කර ඇත. වනාන්තර විනාශ කර ඇත. ක්ෂුද්‍ර ජීවීන්ගේ සිට විශාල වන සතුන්ට ද, මුහුදු ජීවීන් ද වඳ කිරීමේ කාර්යයේ අපි යෙදී සිටිමු. ඉවක් බවක් අරපරිස්සමක් නැතිව ඛණිජ සම්පත් ඇතුළු ස්වභාවික සම්පත් නාස්ති කර ඇත. ඉන් නොනැවතුන අපි අපට රැකවරණය දෙමින් තිබුණු ඕසෝන් ස්ථරය ද තුවාල කර ඇත.

මේ සියල්ල එසේ වුවත් නව සහශ්‍රයට පිවිසෙන ලෝකය පරිසරයට මිත්‍රශීලී වූ, තිරසාර ප්‍රවේශයකට අවතීර්ණ වීමේ විශාල උත්සාහයක යෙදී සිටී.

අපි ද, මේ අළුත් ලෝකයට දර්ශනයක්, සැලැස්මක් හා වැඩපිළිවෙළක් ඇතිව ගමන් කරමින් සිටිමු.

අපේ ඉදිරි දර්ශනය හා සංවර්ධන වැඩපිළිවෙළ සකස් කිරීමේ දී ඉතාමත් වැදගත් සාධකයක් වන්නේ දැනට අප සතුව ඇති තත්ත්වයන් විගණනය කර ගැනීමයි. ඒ විගණනය තුළින් 21 වන සියවසට අපි හඳුනාගත් ශක්තීන් හා ඉඩ ප්‍රස්ථා 21 ද, එසේ ම 21 වන සියවසට අපි හඳුනාගත් දුර්වලතා හා තර්ජන 21 ද මම දැන් ඔබ වෙත ඉදිරිපත් කරමි.

“

**වත්මන් ජනාධිපති ක්‍රමය අහෝසි කර බලය විමධ්‍යගත වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ක්‍රියාත්මක කිරීම.**

**නවීන කර්මාන්ත සංවර්ධන ක්‍රියාදාමයට හා ගෝලීයකරණයට ගැළපෙන අයුරින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම.**

”

21 වන සියවසට අපි හඳුනාගත් ශක්තීන් හා ඉඩ ප්‍රස්ථා 21 ද, එසේ ම 21 වන සියවසට අපි හඳුනාගත් දුර්වලතා හා තර්ජන 21 ද මම දැන් ඔබ වෙත ඉදිරිපත් කරමි.

**ශක්තීන් හා ඉඩ ප්‍රස්ථා**

1. ශ්‍රී ලංකා භූගෝලීය පිහිටීම හා භූමි ප්‍රමාණය.
2. රටේ දේශගුණික තත්ත්වය.
3. චමත්කාර පරිසරය.
4. ස්වභාවික උපද්‍රවයන් හා ව්‍යවසනයන් නොමැතිවීම.
5. ස්වභාවික හා ආර්ථික සම්පත් බහුලවීම.
6. සාගර හා වෙරළ සම්පත.
7. අපේ උසස් සංස්කෘතික, ඓතිහාසික පෞරාණික සම්පත් හා ශ්‍රේෂ්ඨ ශිෂ්ටාචාරය
8. අප තුළ ඇති උසස් සාරධර්ම හා ආගන්තුක සත්කාර
9. උගත් මානව සම්පත
10. තාක්ෂණික හා ශිල්පීය නව දැනුම ඉතා ඉක්මනින් උකහා ගත හැකි ශ්‍රම බලකායක් සිටීම.
11. සෞඛ්‍ය සම්පන්න ජනතාවක් සිටීම.
12. ශක්තිමත් දියුණු වෙමින් පවතින ආර්ථික දර්ශනයක් හා සාර්ථකව ක්‍රියාත්මක වන සංවර්ධන වැඩපිළිවෙළක්
13. අපගේ නිෂ්පාදන භාණ්ඩ බොහොමයක් අපනයන මට්ටමේ හා ජීවන චක්‍රයේ මුල් අවස්ථාවේ පවතින නිසා ඒවා වර්ධනය කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා. දියුණු කාර්මික රටවලට අවශ්‍ය උපාංග සැපයීමට ඇති ඉඩ ප්‍රස්ථා.
14. වැඩි තරුණ ජනගහනයක් සිටීම හා අඩු ජනගහන වර්ධනය.
15. රැකියා හිඟය සාර්ථකව අඩු කිරීම.
16. ප්‍රජාතන්ත්‍රීය රටක් වීම.
17. ජාත්‍යන්තර පිළිගැනීම.
18. ජාත්‍යන්තර බලපෑම් අඩුවීම.
19. දකුණු ආසියානු හා ආසියානු වෙළඳ පොළ අවස්ථාව ලබාගන්නට හැකිවීම.
20. ලෝක වෙළඳ පොළ හා ගෝලීයකරණයෙන් ඇතිවන අවස්ථා.

21.දිළිඳු ජනකොටස් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේ විශේෂ සම්ප්‍රදායන්.

**දුර්වලතා හා තර්ජන 21 ක් ද මම දැන් මෙසේ ඉදිරිපත් කරමි.**

1. යුද්ධය හා ජනවාර්ගික ගැටළුව.
2. දුප්පත්කම හා බැඳුනු පසුගාමී තත්ත්වය.
3. ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිවීම.
4. දේශීය ආයෝජන අඩු මට්ටමක පැවතීම.
5. ප්‍රාථමික කර්මාන්ත හා ප්‍රාථමික කෘෂිකාර්මික ක්‍රම.
6. යල්පැන ගිය පරිපාලන නීතිරීති හා ව්‍යුහයන්.
7. දිගු හා මැදි කාලීන සැලසුම් හා ඉලක්ක මත වැඩ කිරීමේ අත්දැකීම් අඩුකම.
8. 1994ට පෙර කාලයේ තිබූ අනර්ථකාරී විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා ඇති වූ ඵල විපාක.
9. නිෂ්පාදනවල පිරිවැය ඉහළ මට්ටමක පැවතීම හා ඵලදාව පහළ මට්ටමක පැවතීම.
10. යටත් විජිත සුඛසාධන හා යැපුම් මානසිකත්වය.
11. අඩු කැපවීම, අඩු පොළඹවීම හා අකාර්යක්ෂමතාව.
12. පැරණි චින්තන මණ්ඩලවලින් ඉවත් නව චින්තන මණ්ඩලවලට ඇතුළුවීමට දක්වන අකමැත්ත. 17 වසරේ අඳුරු අවධියේ ප්‍රතිඵල වශයෙන් නව චින්තන මණ්ඩල, නව නිෂ්පාදන, නව සොයාගැනීම් නිර්මාණය වීම අඩුමට්ටමක පැවතීම.
13. ඒ නිසා ම රට තුළ බුද්ධිමත්, සමාජ, ආර්ථික සංවාදයක් නොමැතිවීම.
14. වෘත්තීය සමිති නායකත්ව නව සංකල්ප ක්‍රියාදාමයන්ට අවතීර්ණ වීමට පෙන්වන විරෝධතාව.
15. ජාතික හා ආයතනික අභිමතාර්ථ යටපත් වෙමින් පුද්ගලික අභිමතාර්ථ ඉස්මතු වන හැසිරීම් රටාව.
16. දේශීයත්වය භාර ගැනීමට දක්වන අකමැත්ත.

“

**තාක්ෂණික හා ශිල්පීය නව දැනුම ඉතා ඉක්මණින් උකහා ගත හැකි ශ්‍රම බලකායක් සිටීම.**

**රැකියා හිඟය සාර්ථකව අඩු කිරීම.**

**දකුණු ආසියානු හා ආසියානු වෙළඳ පොළ අවස්ථාව ලබාගන්නට හැකිවීම.**

**දිළිඳු ජනකොටස් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේ විශේෂ සම්ප්‍රදායන්.**

”

1994ට පෙර කාලයේ තිබූ අනර්ථකාරී විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා ඇති වූ ඵල විපාක.

රට තුළ බුද්ධිමත්, සමාජ, ආර්ථික සංවාදයක් නොමැතිවීම.

ජාතික හා ආයතනික අභිමතාර්ථ යටපත් වෙමින් පුද්ගලික අභිමතාර්ථ ඉස්මතු වන හැසිරීම් රටාව.

ජනතා සටනට කැපවුණු, අවංක දේශපාලන නායකයන් හිඟවීම.

17. මත් ද්‍රව්‍ය, මත්කුඩු, දුම්වැටි හා ඒඩ්ස් වැනි සමාජ ප්‍රශ්න.
18. ශීඝ්‍රයෙන් දියුණුවන දකුණු ආසියානු හා ආසියානු ආර්ථිකයේ අහිසි බලපෑම.
19. ගෝලීයකරණය හා ජාත්‍යන්තර ගිවිසුම් හේතුකොට ගෙන ඇති වන අනර්ථකාරී බලපෑම් (WTO වැනි ගිවිසුම්වලින් ඇතිවීමට හැකි බලපෑම.)
20. ජනතා සටනට කැපවුණු, අවංක දේශපාලන නායකයන් හිඟවීම.
21. රාජ්‍ය තන්ත්‍රය හා මුළු සමාජය පුරා ම පැතිර ගොස් තිබෙන දූෂණය.

මෙතෙක් අප කළ දේ හා ලැබූ ජයග්‍රහණය තව දුරටත් ඉදිරියට ගෙනයමින් මා ඉහතින් දක්වූ දුර්වලතා හා තර්ජන මඟහැරීම හා නිවැරදි කර ගැනීම අපේ වගකීමකි. අප හඳුනාගත් ශක්තීන් හා අවස්ථා උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීමට අප කැපවිය යුතුය. අප අපේක්ෂා කරන ඉලක්ක සපුරා ගැනීමට අපි ප්‍රධාන වශයෙන් පහත වෙනස්කම් කිරීමට කටයුතු කර ඇත.

1. උපාය මාර්ග සංවර්ධනය.
2. ව්‍යුහාත්මක වෙනස්කම්.
3. අපේ මානව හා භෞතික සම්පත් පදනම මනා ලෙස සංකලනය කොට අද අපි ක්‍රියාවට නංවමින් සිටිමු.

ලෝකයත් විශේෂයෙන් ආසියාවත්, විශාල ආර්ථික අර්බුදයකට ඇද වැටෙද්දී අප මේ පස් අවුරුදු කාලය තුළ අපේ ආර්ථිකයේ මූල්‍ය විනයක් හා ප්‍රශස්ථ කළමනාකරණයක් ගොඩනැගීමට දැරූ උත්සාහයන් බොහෝ දුරට ජයගෙන ඇත. ඒ නිසා අපි ලෝක අර්බුදයෙන් මෙන් ම, ආසියානු අර්බුදයෙන් ද ලැබිය යුතුව තිබූ පීඩාවන් අවම කර ගතිමු.

මේ සැමට වඩා අපි මේ අර්බුදයෙන් අපේ රට ගැනත්, ලෝකය ගැනත්, අලුත් පාඩම් ඉගෙන ගතිමු.

අප මෙන්ම ආසියාතිකයෝත්, සමස්ත ලෝක වාසීනුත් මේ අර්බුදයෙන් අලුත් පාඩම් ඉගෙන ගනිමින් සිටිති. ඒ අත්දැකීම්, අවබෝධය හා පදනම මත 21 වන සියවසේ ගමන් මඟ හා අපේ දර්ශනය මම දැන් මෙසේ ඉදිරිපත් කරමි.

## 21 වැනි සියවසේ අපේ දර්ශනය

වසර 2010 වන විට ආර්ථික වශයෙන් දියුණු සමෘද්ධිමත්, දේශපාලන ස්වාධීනත්වය හා ස්ථාවර භාවය ද, ප්‍රශස්ත ප්‍රජාතන්ත්‍රවාදය රැක ගනිමින් සමාජීය සාධාරණත්වය සහතික කළ ජාත්‍යන්තර වශයෙන් තරගකාරී හා මිත්‍රශීලී ශ්‍රී ලංකාවක් බිහි කිරීම අපේ රජයේ නව දර්ශනය වේ.

ජනතා හිතවාදී, තිරසාර සැලසුම් සහගත, ජනහිතකාමී විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් තුළින් ශ්‍රී ලංකික ජාතික උරුමයන් හා වටිනාකම් රැකගනිමින් මෙම දර්ශනය ක්‍රියාත්මක කෙරේ.

1. වාර්ගික අර්බුදය විසඳීමත් සමග ම නිදහස හා මානව අයිතිවාසිකම් ගරු කරන්නා වූත්, ජනතාව වෙත වැඩි වැඩියෙන් බලතල පැවරෙන්නො වූත්, පරිපාලන ක්‍රමයක් බිහිවනු ඇත.

2. විවෘත වූත් නීත්‍යානුකූල වූ ත්, සාමකාමී වූ ත්, ක්‍රමයක් මඟින් සමානාත්මතාව ප්‍රගුණ කළ හැකි වනු ඇත. ඊට පදනම වනුයේ විවිධත්වය තුළින් ඉස්මතු වන ඒකීයභාවයයි. එක් එක් ජනවර්ගය, ආගම හා කුලය වැනි පටු භේද අනුව නොසිතන එහෙත් සියල්ලන්ම ශ්‍රී ලාංකිකයන් වශයෙන් සිතන පතන යුගයක් උදාවනු ඇත.

3. වසර 2005 දී රුපියල් 84,000/- දක්වාත්, (එනම් ඇ. ඩො. 1200/- දක්වාත්) වසර 2010 දී රුපියල් 178,000/-දක්වාත් (එනම් ඇ. ඩො. 2500/- දක්වාත්) ඒක පුද්ගල ආදායම ඉහළ නැංවීම අපගේ අපේක්ෂාවයි. ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සැම දෙනා අතර සාධාරණව බෙදී යන බව සහතික කිරීමට අපි වෙර දරමු.

> **අපි ලෝක අර්බුදයෙන් මෙන් ම, ආසියානු අර්බුදයෙන් ද ලැබිය යුතුව තිබූ පීඩාවන් අවම කර ගතිමු.**

වසර 2010 වන විට ආර්ථික වශයෙන් දියුණු සමෘද්ධිමත්, දේශපාලන ස්වාධීනත්වය හා ස්ථාවර භාවය ද, ප්‍රශස්ත ප්‍රජාතන්ත්‍රවාදය රැක ගනිමින් සමාජීය සාධාරණත්වය සහතික කළ ජාත්‍යන්තර වශයෙන් තරගකාරී හා මිත්‍රශීලී ශ්‍රී ලංකාවක් බිහි කිරීම අපේ රජයේ නව දර්ශනය වේ.

" ආර්ථික වශයෙන් දියුණු හා සමෘද්ධිමත් " යනුවෙන් අප අදහස් කරන්නේ 2005 වන විට අප රටේ ඒක පුද්ගල ආදායම (ඇමරිකානු ඩොලර් 1200) රුපියල් 84,000.00 දක්වා ඉහළ නැංවීමත්‍ය.

4. ආර්ථික සංවර්ධනය ළඟා කර ගත යුතුව ඇත්තේ කාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම තුළිනි. විශේෂයෙන්ම ධනවත් රටවල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවයන්ට ගැළපෙන කාර්මික නිපැයුම් කෙරෙහි වැඩි අවධානය යොමු කෙරෙනු ඇත.

5. පරිසර දූෂණයත්, පරිසර විනාශයත් සිදු නොවන බවට වග බලා ගනිමින් සංවර්ධන ක්‍රියාවලියේ දී පරිසරය සංරක්ෂණය කිරීමට කටයුතු කෙරෙනු ඇත.

6. ශ්‍රී ලංකාව කිසිදු බල කඳවුරකට නොබැඳෙනු ඇත. එහෙත් සෑම ජාතීන්ගේම විශ්වාසය හා මිත්‍රත්වය දිනා ගැනීමට කටයුතු කරනු ඇත. එමෙන්ම ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී වීමටත් බලාපොරොත්තු වෙමු.

7. ධනවාදයේත්, සමාජවාදයේත්, අඩු ලුහුඩුකම් ඉවතලා ඒ මතවාද දෙකෙහිම යහපත් අංග සංකලනය කිරීමෙන් නව ක්‍රමයක් බිහි කිරීමට අපි අදහස් කරමු.

ජනතාවට සුබදායී වන සංවර්ධන ක්‍රියාදාමයක් ක්‍රියාවට නැංවීම අප ප්‍රධාන අරමුණයි. ධනවාදයේ කාර්යක්ෂමභාව, මූල්‍ය ශක්තිය, තාක්ෂණය ද, සමාජවාදයේ මිනිස්කම හා ජනතාහිතවාදී ප්‍රතිපත්තීන් ද එකට බද්ධ කර ජනතාව වෙනුවෙන් අප ක්‍රියාත්මක වෙමු. සියලු ජනතාවට නිවාස, ජලය, අධ්‍යාපන, හා සෞඛ්‍ය පහසුකම්, සහතික ලෙස ලබාදීමේ සමාජවාදී දර්ශනය තුළ ඇති මිනිස්කම අපේ සංවර්ධන ක්‍රියාවලිය පුරා තහවුරු කිරීමට කටයුතු කරනු ඇත.

**වසර 2010 වන විට අප ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන ඉලක්කයන්.**

වාර්ෂික ආර්ථික වර්ධන වේගය 7% – 8% මට්ටමක පවත්වාගෙන යාම හා ආර්ථික ක්‍රියාවලින් තීව්‍ර කිරීම.

**ඒක පුද්ගල ආදායම**

දැනට ඩොලර් 850 (රුපියල් 60,000)ක් වන ඒක පුද්ගල ආදායම වසර 2010දී ඩොලර් 2500 (රුපියල් 178,000) දක්වා වැඩි කිරීම.

**වාර්ෂික ආර්ථික වර්ධන වේගය 7% - 8% මට්ටමක පවත්වාගෙන යාම හා ආර්ථික ක්‍රියාවලින් තීව්‍ර කිරීම.**

### ආදායම් ව්‍යාප්තිය

ජනගහනයේ පහළ ම ආදායම් පරාසයට දැනට වැටෙන සියයට 4ක් වූ ආදායම් ප්‍රතිශතය වසර 2010 වන විට 15% දක්වා වැඩි කිරීම තුළින් අඩුම ආදායම් ලබන ලක්ෂ 80ක් පමණ ජන කොටස්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම.

### අයවැය හිඟය

අවුරුදු ගණනාවක් පැවති 13% පමණ අධික අයවැය හිඟය 8%ක පමණ මට්ටමකට අඩුකර ඇති අතර, මෙය වසර 2005 දී 5%ට අඩු මට්ටමකට අඩුකර ගනිමින් වසර 2010 දී 3% දක්වා අඩු කිරීම.

### උද්ධමන වේගය

1994ට පෙර 14%ට අධිකව පැවතුණු උද්ධමන වේගය දැනට 5% දක්වා අඩු කර ඇත. මෙය වසර 2010 දී 3% මට්ටමක පවත්වා ගැනීමයි.

### ඉතිරි කිරීම්

පසුගිය පස් වසර තුළ 17% සිට 23% දක්වා වැඩි කරනු ලැබූ ඉතිරි කිරීමේ ප්‍රතිශතය වසර 2010 දී 35% දක්වා වැඩි කිරීම. ආයෝජනය හා සංවර්ධන සඳහා විදේශාධාර මතම රැඳී සිටීමට මෙ නිසා අපට අවශ්‍ය නොවනු ඇත.

### මූල්‍ය ස්ථාවරත්වය

මුදල් සැපයුම ආර්ථික වර්ධනයට සරිලන ආකාරයට පවත්වා ගනිමින් මූල්‍ය ස්ථාවරත්වයක් ඇති කිරීම, පොලී අනුපාතිකය පොදුවේ 19% සිට 12% දක්වා දැනට අඩු කර ඇත. මෙය තව දුරටත් අඩුකර පවත්වා ගැනීම.

### යටිතල පහසුකම්

මූලික යටිතල පහසුකම් වන පානීය ජලය, විදුලිය හා නිවාස වසර 2010 දී ජනගහනයෙන් 100%ක් දක්වා පුළුල් කිරීම හා දුරකථන, ගමනාගමන වැනි පහසුකම් ශීඝ්‍ර ලෙස දිවයින පුරා ව්‍යාප්ත කිරීම.

“ පුද්ගල ආදායම වසර 2010දී ඩොලර් 2500 (රුපියල් 1,75,000) දක්වා වැඩි කිරීම.

දැනට වැටෙන ආදායම් ප්‍රතිශතය 4% ප්‍රමාණය වසර 2010 වන විට 15% දක්වා වැඩි කිරීම

අය වැය හිඟය සියයට 13 සිට දැනට 8% දක්වා අප අඩු කර ඇත. මෙය වසර 2010 3% මට්ටමක පවත්වා ගැනීම. ”

ප්‍රධාන නගර, කොළඹ නගරය හා සම්බන්ධ වන අධිවේගී මාර්ග පද්ධතිය වසර 2005 දී සම්පූර්ණ කිරීම හා පොදුවේ මහාමාර්ග පද්ධතිය වසර 2010 දී නවීකරණය කිරීම හා දියුණු කිරීම.

**නිෂ්පාදන ක්ෂේත්‍ර**

කෘෂි හා ධීවර නිෂ්පාදන නවීනකරණයට හා විවිධාංගීකරණයට ලක් කෙරේ. තරඟකාරී මිල ගණන් තුළින් අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන ද්‍රව්‍යයන් වන වී, අල, ලූණු, මිරිස් හා එළවලුවලින් වසර 2010 දී ස්වයංපෝෂිත කිරීම.

අපනයන වෙළෙඳ පළ කරා යොමු වූ කාර්මික භාණ්ඩ නිෂ්පාදන වර්ධන වේගය 12%ට වර්ධනය කිරීම තුළින් කාර්මික නිෂ්පාදනය දෙගුණ කිරීම.

හොඳ සේව්‍ය සේවක සබඳතා තුළින් වැඩපළ වල සාමකාමී වාතාවරණයක් ඇති කිරීම.

**ආගම**

බෞද්ධාගම ප්‍රමුඛ අප රටේ පවතින අනෙකුත් ආගම් වලින් උගන්වන ආගමික හා අධ්‍යාත්මක හර පද්ධතීන් වඩාත් පුළුල් ලෙස අප තරුණ පරපුර කරා රැගෙන ගොස් ඔවුන්ට වත්මන් යුගයේ මුහුණපෑමට සිදු වී තිබෙන අභියෝගයන්ට හා ප්‍රශ්නයනට ශක්තිමත් ලෙස මුහුණදීමට ද අද අප රටේ ඇති වී තිබෙන විවිධ අපචාරයන්ට විසඳුම් හැටියට ද ආගම ජනතාව අතර ට ගෙනයෑම සඳහා සියලු ආගමික නායකයනට උපරිම සහයෝගය ලබාදීම.

දෙමළ ජනතාවගේත්, අනෙකුත් සුළු ජාතීන්ගේත් ප්‍රශ්න වසර 2000 දී දේශපාලන ක්‍රියා මාර්ග තුළින් සාමාකාමීව විසඳනු ඇත. යුද්ධයෙන් සිදු වන අනර්ථකාරී මහා විනාශය එ මගින් නිමා වනු ඇත.

මෙම උදාර කාර්යයේ දී මා හා එක්වන ලෙස දේශපාලන විසඳුමකට අකමැති එල්ටීටීඊ සංවිධානය, එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ වැනි කණ්ඩායම්වලට මම ආරාධනා කරමි.

### රාජ්‍ය සේවය

රාජ්‍ය සේවය, පොලිසිය හා ආරක්ෂක සේවාවන් රජයක ක්‍රියාකාරිත්වයේ කොඳු නාරටිය සේ අප සලකන්නෙමු. මෙම සේවාවන්හි නියුක්ත සියලු දෙනාට ම ඔවුන්ට හිමිවිය යුතු අභිමානය තහවුරු කිරීම සඳහා දැනට මත් අප රජය විසින් ක්‍රියා මාර්ගයන් ගෙන ඇති අතර, විශේෂයෙන් ඔවුනගේ පඩි හා දීමනා වැඩි කරමින් පෞද්ගලික අංශයේ පවතින පඩි නඩිවලට සාමන තත්ත්වයකට 2010 වන විට ගෙන ඒමට කටයුතු කිරීම.

සෑම රජයේ සේවකයකුටම විදුලිය, පානීය ජලය, විදුලි සංදේශ පහසුකම් සහිත තමාගේම නිවසක් ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

සියලු රජයේ සේවකයින්ට තම දරුවනට හොඳ අධ්‍යාපනයක් ලබාදීමට අවශ්‍ය පහසුකම් සම්පූර්ණ කිරීම.

### සෞඛ්‍යය

ග්‍රාමීය රෝහල් වැඩි දියුණු කිරීම හා සෑම දිස්ත්‍රික්කයකම අංග සම්පූර්ණ රෝහල් කීපයක් ඇති කිරීමත්, සෑම පළාතකම විශේෂඥ සේවාවන් සහිත රෝහල් පද්ධතියක් ගොඩනගා ගැනීම.

### අධ්‍යාපනය

අරඹා ඇති අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් නව ආර්ථිකයට ගැළපෙන කුසලතාවන්ගෙන් හා මිනිස්කමින් පිරිපුන් තරුණ පරපුරක් ඇති කිරීම.

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම අංග සම්පූර්ණ හොඳ පාසල් 3ක් 2010 වනවිට ගොඩ නැඟීම. විද්‍යාව, තාක්ෂණය, හා විදේශ භාෂා ඉගැන්වීමට සියලු පහසුකම් සැපයීම.

### වතුකරයේ ජනතාව

වතු අංශයේ ජීවත් වන ජනතාවට නිවාස, පානීය ජලය, විදුලිය, පාසල්, සෞඛ්‍ය පහසුකම්වලින් 75%ක් සම්පූර්ණ කිරීම.

**"මූලික යටිතල පහසුකම් වන පානීය ජලය, විදුලිය හා නිවාස වසර 2010 දී ජනගහනයෙන් 100%ක් දක්වා පුළුල් කිරීම හා දුරකථන, ගමනාගමන වැනි පහසුකම් ශීඝ්‍ර ලෙස දිවයින පුරා ව්‍යාප්ත කිරීම.**

**කාර්මික භාණ්ඩ නිෂ්පාදන වර්ධන වේගය 12%ට වර්ධනය කිරීම තුළින් කාර්මික නිෂ්පාදනය දෙගුණ කිරීම."**

**"සෑම රජයේ සේවකයකුටම විදුලිය, පානීය ජලය, විදුලි සංදේශ පහසුකම් සහිත තමාගේම නිවසක් ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.**

**සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම අංග සම්පූර්ණ හොඳ පාසල් 3ක් 2010 වනවිට ගොඩ නැගීම. විද්‍යාව, තාක්ෂණය, හා විදේශ භාෂා ඉගැන්වීමට සියලු පහසුකම් සැපයීම."**

### පරිසරය

කෘෂිකර්මය, කර්මාන්තශාලා, මෝටර් රථ, වන විනාශය, වනාන්තර කැපීම හා පරිසරයට හානිවන ද්‍රව්‍ය පාවිච්චිය තුළින් ඇතිවන පරිසර හානිය හැකිතාක් අවම කිරීම. පරිසරය ආරක්ෂා කිරීමට, අගය කිරීමට පාසල් දරුවන්ට පුරුදු පුහුණු කිරීම.

### ඵලදායිතාව

කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශවල ඵලදායිතාව 75%කින් වැඩි කිරීම.

### ළමා පරපුර

ළමා අධ්‍යාපනය, 100%ක් වර්ධනය කිරීම, ළමා මන්දපෝෂණය, ළමා අපචාර, ළමා ශ්‍රම සූරාකෑම උපරිම වශයෙන් අඩු කිරීම.

### තරුණ පරපුර

රැකියා විරහිතකම 14.1% සිට 9% දක්වා අඩුකර ඇත. එය 2010 වනවිට 5% දක්වා අඩු කිරීම.

උසස් අධ්‍යාපනය කරා නොයන තරුණතරුණියන්ට වෘත්තිය පුහුණුව ලබාදීම.

සෑම තරුණතරුණියකටම ක්‍රීඩා සහ කලාත්මක පහසුකම් ලබාදීම.

ඒ සඳහා ක්‍රීඩා මධ්‍යස්ථාන හා සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩ නැගීම.

මත් කුඩු, මත් ද්‍රව්‍ය, දුම්වැටි උවදුර වැනි සමාජ අපචාර 75%කින් අඩු කිරීම.

### ජ්‍යෙෂ්ඨ පුරවැසියන්.

සෑම දිස්ත්‍රික්කයකම විවිධ පහසුකම් සහිත අංග සම්පූර්ණ වැඩිහිටි මධ්‍යස්ථාන හා වැඩිහිටි නිවාස ඇති කිරීම.

### කාන්තාවන්

(ශ්‍රේෂ්ඨ කාන්තා පරපුරකට හිමිකම් කියන) අප සමාජය තුළ කාන්තා අයිතිවාසිකම් තහවුරු කර

"කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශවල ඵලදායිතාව 75%කින් වැඩි කිරීම.

විරැකියාව 14.1% සිට 9% දක්වා අඩුකර ඇත. එය 2010 වනවිට 5% දක්වා අඩු කිරීම.

සමාජ අපචාර - මත් කුඩු, මත් ද්‍රව්‍ය, දුම්වැටි උවදුර 75%කින් අඩු කිරීම."

වර්ධනය කිරීමට දැනට ක්‍රියාත්මක වන විශේෂ වැඩ පිළිවෙළ තියුණු කිරීම.

### ආබාධිත හා අවතැන්වූවන්

යුද්ධය හා භීෂණය තුළින් මානසිකව හා ශාරීරිකව ආබාධයන්ට ලක්වූවන් සඳහා සහනයක් සැලසීමට අධිකාරියක් ඇරඹීමට දැනට කටයුතු කර ගෙන යනු ඇත.

මව්බිමේ උරුමය රකිමින් ජාතියක් සාර්ථකව ගොඩනැගීම සඳහා වූ තීරණාත්මක මූලික අවශ්‍යතාවක් වශයෙන් සියලු දෙනා තේරුම් ගත් හා එකඟ වූ දර්ශනයක් තිබීමය අත්‍යාවශ්‍යය. එවැනි දර්ශනයක් තුළින් අනාගත දිශාව පිළිබඳ ව ගැඹුරු ආවේගශීලි චින්තනයක් මතු කෙරේ.

අපගේ සංවර්ධන ප්‍රවේශය නිසා 2010 වන විට ශ්‍රී ලංකාව අනිවාර්යයෙන්ම නව කලාපීය කාර්මික හා සේවා ආර්ථිකයක් බවට පරිවර්තනය වීම වැළැක්විය නොහැකි වනු ඇත. මේ නව ප්‍රවණතාවයන්ගෙන් ඇති වන අභියෝගවලට මුහුණදීමේ හැකියාව නොමැතිව දිළිඳු වන අය මෙන් ම, වැඩිහිටි හා ශාරීරික දුබලතාවන්ගෙන් යුක්ත ජන කොටස් සඳහා සමාජ රක්ෂණ ක්‍රමයක් ඇති කිරීමට අපි සූදානම් ව සිටිමු.

අද මා මේ රටේ ජනතාව වෙත ඉදිරිපත් කරන මේ දර්ශනය හා ඉලක්ක පිළිබඳ ඔබගේ යෝජනා, අදහස් හා විවේචන අපි සාදරයෙන් භාර ගැනීමට සූදානම් ව සිටිමු. සමාජීයීය වගකීමක් සහිත ජනතාව හැටියට ඔබත් වගකිව යුතු ජනතාවගෙන් සැදුම්ලත් සංවිධාන හා දේශපාලන පක්ෂත්, ව්‍යාපාරික ප්‍රජාවත් මේ යුතුකම ඉටු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි.

මෙම වැඩ පිළිවෙළ හා දර්ශනය සාර්ථකව ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මිනිස් සම්පත් මෙන් ම ද්‍රව්‍යමය සම්පත් ද ප්‍රමාණවත් තරම් අප සතුව ඇත. අපට ලැබෙන සහයෝගයත්, අප කෙරෙහි ඔබ තබා ඇති විශ්වාසයත් අපේ ශක්තිය වේ. ඊළඟ දශකයේ දී සමෘද්ධිමත් රටක් ගොඩනැගීම සඳහා වූ අපේ

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



ඉලක්කය සපුරා ගැනීම සඳහා ඔබේ අකලංක සහාය ලැබෙන බව මම දනිමි.

වසර පහක් තිස්සේ ආ අර්ථවත් ගමන තව දුරටත් ඉදිරියට යාමේ සන්ධිස්ථානයේ දී අපේ ජනතාවගේ අභිලාෂයන් අනුව යමින්, තව දුරටත් ඉදිරියට යන බව සඳහන් කරනු කැමැත්තෙමි. මේ කාර්යයේ දී අප අධිෂ්ඨානශීලීව ඇප කැප වී සිටිමු. ඔබ අප කෙරෙහි ඉදිරියටත් විශ්වාසය තබන්නේ නම් එළඹෙන සියවස කරා පෙරට ම පිය නැඟීමට අපට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය තව දුරටත් අපට ලබා දෙනු මැනවි. ඔබ හා සමඟ පෙරට යන මේ ගමනේ දී පූර්ණ අවංකභාවයකින් හා කැපවීමකින් යුක්තව කාර්යක්ෂමව ඉදිරියට යාමට අපි පොරොත්තු වෙමු. අපේ රජයට පස් වසරක් සපිරෙන අද දින මා පෞද්ගලිකවත්, අපේ ඇමතිවරුන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙනුත්, රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන් වෙනුවෙනුත් මම ගෞරව බහුමානයෙන් යුක්තව මෙම ප්‍රතිඥාව දෙමි.

**මිත්‍රවරුනි, මව්පියවරුනි, සහෝදර සහෝදරයිනි, දරු දැරියනි ,**

නව සියවසට පා තැබීමට සූදානම් වන අපට අද ඇති ප්‍රධාන අභියෝගය වන්නේ රට බෙදා වෙන් කිරීමට දරන උත්සාහය වැළැක්වීමයි, යුද්ධය වහාම අවසන් කිරීමයි. නැවත යුද්ධයක් ඇති නොවන ලෙස දේශපාලන විසඳුම් ස්ථිරසාරව ස්ථාපිත කිරීමයි.

මේ තීරණාත්මක හා උතුම් කාර්ය සඳහා යුක්තිය, සාධාරණත්වය, සාමය හා මනුෂ්‍යකම ගරු කරන සියලු ජනතාවට අප සමග එකතු වන ලෙස මේ රටේ රාජ්‍ය නායිකාව ලෙස නිහතමානීව හා ඉතා ඕනෑකමින් ආරාධනා කරමි.

ඔබ කුමන ජාතියකට, ආගමකට, ජන කොටසකට අයත් වුවත්, කුමන දේශපාලන පක්ෂයක සාමාජිකයකු වුවත්, ඔබ මේ රටේ පුරවැසියෙක් නම්, ඔබ මේ ශ්‍රේෂ්ට ලාංකික ජාතියේ සාමාජිකයෙක් නම්, මගේ මේ කාරුණික ඉල්ලීම ඔබට ඉවතහළ නොහැකි බව මම විශ්වාස කරමි.

"ගුණාංග 03 හරහා ගොඩනැගෙන අපේ දර්ශනය විසින් දේශපාලන වශයෙන් ස්වාධීන හා ස්ථාවර, ආර්ථික වශයෙන් සංවර්ධිත රටක් නිර්මාණය කරනු ඇත."

යෝජනා හා අදහස්
සාදරයෙන් භාරගනිමි

මේ නිසා මට නැවත සියලු දේශපාලන පක්ෂවලට යුද්ධය අවසන් කිරිමට අප සමග එක්වන ලෙස ආරාධනා කරමි. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයට මම ආරාධනා කරමි. ජනතා විමුක්ති පෙරමුණට ද මම ආරාධනය කරමි. මේ රටේ සාමය කැමති සියලු ජනතාවට මේ කාර්ය සඳහා දේශපාලන නායකයන් පෙළඹවීමට දායක වන ලෙස ද මම ආරාධනා කරමි.

අද වන විට අපේ දමිළ ජනතාව එල්. ටී. ටී. නායකත්වය සාමකාමී විසඳුමක් කරා යොමු කිරිමට පොලඹවමින් සිටී. අපේ සිංහල, මුස්ලිම් ජනතාව ද, මේ කාර්ය දැන් ආරම්භ කළ යුතු යැයි මම විශ්වාස කරමි.

අපේ මාතෘ භූමිය 21 වන ශත වර්ෂයට ගැළපෙන පරිදි ගොඩනැගීමේ කාලය දැන් එළඹ ඇත. ඒ සත්කාරය සඳහා ජාති, ආගම්, කුල හා දේශපාලන භේදයෙන් තොර ව අප සැම එක්වෙමු. නව සියවසට අප ශක්තිමත්, සමෘද්ධිමත් හා සාමාකාමී දේශයක ජනතාව ලෙස පා තබමු.

**ඔබ සියලුදෙනාට ම තුණුරුවන්ගේ පිහිට පතමින් මම නවතිමි.**

"නව සියවසට පා තැබීමට සූදානම් වන අපට අද ඇති ප්‍රධාන අභියෝගය වන්නේ රට බෙදා වෙන් කිරීමට දරන උත්සහාය වැළැක්වීමයි, යුද්ධය වහාම අවසන් කිරීමයි. නැවත යුද්ධයක් ඇති නොවන ලෙස දේශපාලන විසඳුම් ස්ථිරසාරව ස්ථාපිත කිරීමයි."

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

විසිඑක්වන සියවසට නව දර්ශනයක්

රජයේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.